චක්‍රලේඛ අංක - 06/2011

බප/සසේකො/ලේ.නිර්/2011
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
121/3, කිරුළපන මාවත,
කොළඹ 05.
2011.11. 16

බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම් . ස.ණ.ස. සමිති හා
අනුමත වෙනත් සමුපකාර සමිති වල
සභාපතිවරුන් වෙත.

**<u>බස්නාහිර පළාත් සමුපකාර සේවක III පන්තියට බඳවා ගැනීම සඳහා</u>**
**<u>බඳවා ගැනීම් පරිපාටිය, උසස් කිරීමේ පරිපාටිය හා ඊට අදාල වෙනත් උපදෙස්.</u>**

2010.04.01 දින සිට බල පැවැත්වෙන පරිදි බස්නාහිර පළාත් සමුපකාර සමිති වල අනුමත තනතුරු සඳහා සමුපකාර සේවක III පන්තියට බඳවා ගැනීමේ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පරිපාටි බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ඉදිරියේදී කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව අනුමත කර ඇති අතර, එම අනුමත බඳවා ගැනීමේ පරිපාටි මේ සමඟ නිකුත් කරනු ලැබේ.

02. සමුපකාර සේවකයින් අදාළ තනතුරු වල II සහ I පන්ති වලට උසස් කිරීමට අදාළ නව උසස් කිරීමේ පරිපාටි යථා කාලයේදී නිකුත් කරනු ලබන බවද දන්වා සිටිනු ලැබේ.

03. 2011.09.16 දිනැති 04/2011 කොමිසන් සභා චක්‍රලේඛයේ අවසාන ඡේදය පරිදි අත්‍යාවශ්‍ය තනතුරු සඳහා පැරණි සුදුසුකම් අදාල කර ගැනීමට ලබා දී තිබූ තාවකාලික අනුමැතිය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරනු ලබන බව කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වා සිටිමි. එම චක්‍රලේඛයේ අවසාන ඡේදයේ විධිවිධාන අදාළ කර ගනිමින් බඳවා ගැනීම සඳහා 2011.11.15 දිනට පෙර පුරප්පාඩු ප්‍රසිද්ධ කර ඇති තනතුරු සඳහා නොපමාව සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීමේ කටයුතු අවසාන කල යුතුය.

04. 2010.04.01 දින සිට සමුපකාර සේවක තුන්වන පංතියට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අනුගමනය කළයුතු ලකුණුදීමේ ක්‍රියා පරිපාටිය

(6/2007 හා 2007.01.26 දිනැති චක්‍රලේඛය සඳහා ලකුණුදීමේ පරිපාටිය පහත පරිදි සංශෝධනය විය යුතුය.)

| සුදුසුකම | ලකුණු ප්‍රමාණය | |
|---|---|---|
| 1. අධ්‍යාපන සුදුසුකම් | | |
| ▪ මූලික සුදුසුකම් | 15 | 25 |
| ▪ ඊට ඉහළ විභාග සමත්වීම | 10 | |
| 2. ස්ථිර සේවා කාලය | | |
| ▪ ආසන්න වැටුප් පරිමාණයේ වසර එකකට | 05 | 25 |
| ▪ ඊට පහළ වැටුප් පරිමාණයේ වසර එකකට | 02 | |
| 3. සමුපකාර විෂයය පිළිබඳ සමත් විභාග | | |
| ▪ සමුපකාර සාමාන්‍ය පෙළ | 05 | |
| ▪ සමුපකාර උසස් පෙළ | 06 | |
| ▪ තනතුරට අදාළ ඩිප්ලෝමා සහතිකය | 08 | |
| ▪ විවිධ පුහුණු පාඨමාලා | | 25 |
| - මාස 06ට වැඩි | 03 | |
| - මාස 03 - 06 අතර | 02 | |
| - මාස 03ට අඩු | 01 | |
| 4. වෙනත් කරුණු | | |
| ▪ දහම් පාසල් ධර්මාචාර්ය සහතිකය | 06 | |
| ▪ දහම් පාසල් අවසාන සහතිකය - ලකුණු 4 | | |
| ▪ බාල දක්ෂ සහතිකය | 02 | |
| ▪ ජාතික ශිෂ්‍ය බට පුහුණු සහතිකය | 02 | 25 |
| ▪ දරා ඇති විශේෂ වගකීම් | 04 | |
| ▪ අද්‍යාපන හා වෘත්තිය සුදුසුකම් | 05 | |
| ▪ කාර්යක්ෂමතාව | 03 | |
| ▪ නායකත්වය ,හා ක්‍රිඩා, පෞරුෂත්වය | 03 | |

05.

(අ) <u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ (තේරීම්) කාර්යභාරය</u>

7/99 හා 1999.11.11 දිනැති බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛයේ "ඊ" ඡේදයේ උපදෙස් පරිදි සංස්ථාපිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දීමේදී 2011 නව බඳවා ගැනීම් පරිපාටියේ අනුමත ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ඉහත 04 ඡේදයේ දක්වා ඇත. ඒ හැර බඳවා ගැනීම් පරිපාටියේ දැක්වෙන මූලික සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් සම්බන්ධයෙන් සමිති අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ කොමිෂන් සභාව වෙත වෙනත් නිර්දේශ කිසිවක් ඉදිරිපත් නොකල යුතුය.

(ආ) <u>සම්මුඛ පරීක්ෂණ නිරීක්ෂන නිලධාරීගේ කාර්ය භාරය</u>

සමුපකාර සේවක කොමිෂන් සභාවේ නිලධාරියකු හා අදාල සමිතියේ සාමාන්‍යාධිකාරී සම්මුඛ පරීක්ෂණය සඳහා නිරීක්ෂණ මට්ටමින් සහභාගි වේ. ඔවුන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඇතුලත් නොවිය යුතු අතර, ඔවුන්ගේ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

(1) සම්මුඛ පරීක්ෂණයට අදාල සම්පූර්ණ ක්‍රියාවලිය අධ්‍යයනය කර කොමිෂන් සභාව වෙත ස්වාධීන වාර්තාවක් ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට උපදෙස් ලබා දීම කොමිෂන් සභා නිරීක්ෂණ නිලධාරියාගේ කාර්ය භාරයයි.

(11) සම්මුඛ පරීක්ෂණයට අදාල සම්පූර්ණ ක්‍රියාවලිය අධ්‍යයනය කර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ස්වාධීන වාර්තාවක් ඉදිරිපත් කිරීම සමිති නිරීක්ෂණ නිළධාරියාගේ වගකීමවේ.

(ඇ) <u>සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට පෙර සමිතිය විසින් අවධානය යොමු කල යුතු කරුණු</u>

(1) අයදුම්පත් කැඳවන දිනට වලංගු පිරිස් බල තක්සේරුවක් තිබීම

(11) බඳවා ගැනීමට කටයුතු කරන තනතුරු සඳහා අනුමත පිරිස් බල තක්සේරුවේ ඇති සේවක සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි බඳවා ගැනීමට කටයුතු කිරීම

(111) 5/2011 චක්‍රලේඛයේ විධිවිධානයන් අනුගමනය කල යුතු වීම

(1V) පුරප්පාඩු ප්‍රසිද්ධ කල යුතු වීම

(V) ලද අයදුම්පත්‍ර වල දින මුද්‍රාව තබා ඒ මත වගකීම් පවරා ඇති නිලධාරියෙකු අත්සන් තැබීම

(V1) අයදුම්කරුවන් ගේ විස්තර ඇතුලත් උපලේඛනයක් සකස් කල යුතු අතර එහි පිටපත් නිරීක්ෂණ නිලධාරීන් වෙත ලබා දිය යුතුය.

(V11) අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර වල ඇතුලත් සියළු තොරතුරු එම උපලේඛණයේ ඇතුලත්විය යුතු අතර එය සකස්කල හා පරීක්ෂා කල නිලධාරීන් අත්සන් තබා සාමාන්‍යාධිකාරී විසින් අයදුම් පත්‍රයේ දැක්වෙන සියලු තොරතුරු උපලේඛණයේ ඇතුලත්ව ඇති බවට සහතික කලයුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර උප ලේඛණ ගත එක් එක් අයදුම්කරුවන් තනතුරට අදාල මූලික සුදුසුකම් ලබන්නේද නොලබන්නේද යන වග එම උපලේඛණයේ අවසාන තීරුවේ සඳහන් කලයුතු අතරම සුදුසුකම් නොලබන්නේ යයි සඳහන් කල විට ඊට හේතුද කෙටියෙන් ලියා තැබිය යුතුවේ.

(V111) අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ යම් ගැටළුවක් ඇති වුවහොත් සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දිනට ප්‍රථම කොමිෂන් සභාවෙන් විමසා නිරාකරණය කරගත යුතුය.

(1×) පුරප්පාඩු සඳහා ප්‍රථමයෙන් සමිති අභ්‍යන්තරයෙන් ඉල්ලුම්පත් කැඳවිය යුතු අතර එම ඉල්ලුම්පත් කැඳවන දැන්වීම සමිතියේ සියලුම සේවකයින්ට දැනුවත් කල බවට සමිතියේ සාමාන්‍යාධිකාරී හා පිරිස් කළමණාකරු විසින් සහතික කල යුතුය. එම සහතිකයේ පිටපතක් නිරීක්ෂණ නිලධාරී වෙත ලබා දීම.

(ඈ) <u>සම්මුඛ පරීක්ෂණය අවසානයේදී අනුගමනය කල යුතු ක්‍රියා පිලිවෙත</u>

(1) ඒකාබද්ධ ලකුණු ලේඛණය සකස් කර එක් එක් අයදුම්කරුවන් ලබා ගත් ස්ථානය සටහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඊට අත්සන් කිරීම

(11) එම ඒකාබද්ධ ලකුණු ලේඛණයේ සහතික කල පිටපතක් නිරීක්ෂණ නිලධාරී වෙත ලබා දීම

(111) නිරීක්ෂණ නිලධාරීන් ඉල්ලා සිටින ලිපිලේඛණ වල සහතික කරන ලද පිටපත් ලබා දීම

(1V) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හා නිරීක්ෂණ නිලධාරීන්ට අනුමත දීමනා ගෙවීමට කටයුතු කිරීම.

(V) අදාල තනතුරු කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා නියමිත ලිපිලේඛණ සමඟ දින 30 ක් ඇතුලත ඉදිරිපත් කිරීම

(ඉ) සම්මුඛ පරීක්ෂණ අවලංගු විය හැකි අවස්ථා

යම් සම්මුඛ පරීක්ෂණයක් අවිධිමත්ව සිදු වූ බවට තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වුව හොත් ඒ පිලිබඳව කොමිෂන් සභාව විසින් කොමිෂන් සභා නිරීක්ෂණ නිලධාරී වාර්තාව, සමිති නිරීක්ෂණ නිලධාරී වාර්තාව, අදාල සමුපකාර සමිතියෙන් ගෙන්වා ගන්නා ලද තොරතුරු වාර්තාව හා සලකා බැලිය යුතු වෙනත් සියලු තොරතුරු හා වාර්තාද සලකා බලා අදාල සම්මුඛ පරීක්ෂණය අවලංගු කරන්නේ නම් කොමිෂන් සභාව විසින් සමිතිය වෙත ඒ පිලිබඳ නියමයක් ලබා දෙනු ඇත.

එසේ නියමිත ක්‍රමවේදය අනුගමනය නොකිරීම නිසා යම් සම්මුඛ පරීක්ෂණයක් අවලංගු කිරීමට සිදුවුව හොත් නැවත එම සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට දැරිය යුතු වියදමද සමිතිය විසින්ම දරා ගත යුතු වේ.

කොමිෂන් සභාවේ නියමය පරිදි ය.

අයි.ආර්. සෝමසිරි,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :-

1. ප්‍රධාන ලේකම් - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප) - දැ.පි
2. බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශයේ ලේකම් - දැ.පි
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් (බ.ප) - දැ.පි.
4. ලේකම්, මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව - දැ.පි
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ ගම්පහ/කළුතර) - දැ.පි
6. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන් වෙත - දැ.පි
7. සියලුම වෘත්තිය සමිති සංගම් - දැ.පි